සැ. යු.- 2013.11.01 දින පළ වූ අංක 1,835 දරන ගැසට් පත්‍රයේ I : III සහ II කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,836- 2013 නොවැම්බර් 08 වැනි සිකුරාදා - 2013.11.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 2488 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 නොවැම්බර් මස 29 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 නොවැම්බර් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විවිධ දැන්වීම්

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර සිටින ලද 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය යටතේ වූ නියෝගය අනුව සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154(ග) ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාත සඳහා වූ මහාධිකරණයේ දී ය**

*නඩු අංක :*
HC (Civil) 45/2013/CO

මල්වත්ත හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ කාරණාවේ දී ය.

*සහ*

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ වූ කාරණයේ දී ය.

කොළඹ 12, ඩෑම් ස්ට්‍රීට්, අංක 280 දරන ස්ථානයේ පිහිටි මල්වත්ත හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

......................................................*පෙත්සම්කරු.*

බස්නාහිර පළාත්බද කොළඹ දී පවත්වන මහාධිකරණය (වාණිජ මහාධිකරණය) විසින් ඉහත නම සඳහන් සමාගම ණයන් බේරා වසා දමනු ලැබීම සඳහා කොළඹ 12, ඩෑම් ස්ට්‍රීට්, අංක 280 දරන ස්ථානයේ පිහිටි මල්වත්ත හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2013 ඔක්තෝබර් මස 04 වැනි දින එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම 2014 ජනවාරි මස 24 වැනි දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සඳහා සහාය දීමට හෝ ඊට විරුද්ධ වීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණයහිමියකුට හෝ දායකයකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ පුද්ගලිකව හෝ සිය නීතිඥ මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණයහිමියකුට හෝ දායකයකුට නියමිත ගාස්තු ගෙවීම මත, පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අත්සන් කළේ :*

පෝල් රත්නායක ඇසෝසියේට්ස්,
නීතිඥවරු,
අංක 59, ග්‍රෙගරි පාර,
කොළඹ 07.

*සටහන.-* එකී පෙත්සම සම්බන්ධව විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයකු, එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් නීතිඥවරුන් වන පෝල් රත්නායක ඇසෝසියේට්ස් සමාගමට 1939 සමාගම් ණයන් බේරා වසා දැමීමේ රීතිවල දක්වා ඇති අංක 9 ආකෘතියට අනුකූලව සැකසූ ලිඛිත දැන්වීමක් බාරදිය යුතු ය. නැතහොත් තැපෑලෙන් එවිය යුතු ය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම හා ලිපිනය ද, සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය, ණයහිමියකු නම් අයවිය යුතු ණය මුදල ද, දායකයකු නම් තමන්ට හිමි සමාගමේ කොටස් සංඛ්‍යාව ද, දැන්වීමේ ප්‍රකාශ කළයුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥවරයෙක් සිටී නම් නීතිඥවරයා/වරිය විසින් අත්සන් කළ යුතු අතර, 2014 ජනවාරි මස 23 වැනි දින පස්වරු 6.00 ට පෙර බාරදිය යුතු ය. නැතහොත්, තැපැල් මගින් එවන්නේ නම්, ප්‍රමාණවත් කාලය තුළ (ඉහත නම සඳහන් නීතිඥවරුන්) ඔවුන්ට ලැබෙන ලෙස තැපැල් මගින් එවිය යුතු ය.

11-318

---

**සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන (කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය**

කොළඹ 04, බම්බලපිටිය, 2 වැනි ලෝවිරිස් පාර, අංක 46-2/1 හි එහි ලියාපදිංචි කාර්යාලය පිහිටි වර්ල්ඩ්කෝල් ටෙලිකොමියුනිකේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ඈවරකිරීමේ කාරණාව සම්බන්ධවයි.

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටසේ 270 (අ) සහ/හෝ (ඉ) සහ/හෝ (ඊ) වගන්ති යටතේ වර්ල්ඩ්කෝල් ටෙලිකොමියුනිකේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ඈවරකිරීම සඳහා වූ ඉල්ලීම සම්බන්ධවයි.

*නඩු අංක :*
H.C. (Civil) 43/2013/CO

වර්ල්ඩ්කෝල් ටෙලිකොමියුනිකේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 46-2/1, 2 වැනි ලෝවිරිස් පාර,
බම්බලපිටිය, කොළඹ 04.

......................................................*පෙත්සම්කරු.*

ඉහත නම සඳහන් පෙත්සම්කරු විසින්, සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ (වාණිජ) මහාධිකරණය මගින් ඉහත නම් සඳහන් සමාගම ඈවරකිරීම සඳහා වර්ෂ 2013 සැප්තැම්බර් මස 30 වැනි දින පෙත්සමක් එම අධිකරණයට ඉදිරිපත් කළ බවත්, එකී පෙත්සම වර්ෂ 2013 ක් වූ දෙසැම්බර් මස 11 වැනි දින ඇසීමට ගරු අධිකරණය විසින් නියම කර ඇති බවත් මෙයින් දැනුම් දෙනු ලබන අතර, එම පෙත්සම පිළිබඳව නියෝගයක් කිරීමට සහාය දැක්වීමට කැමැත්ත හෝ අකමැත්ත දක්වන එකී සමාගමේ මොනයම් හෝ ණය හිමියකු හෝ එම සමාගමේ සහදායකයකු වෙතොත් තමන් පුද්ගලිකව හෝ තම ලේඛනගත නීතිඥ මගින් ඒ සඳහා ඉදිරිපත් විය හැකි අතර පෙත්සමේ පිටපතක් අවශ්‍ය වෙතොත් මෙහි පහත සඳහන් කරන අයට නියමකර ඇති ගාස්තු ගෙවූ පසු එකී සමාගම මොනයම් හෝ ණයහිමියකුට හෝ එම සමාගමේ සහදායකයකුට සපයනු ලැබේ.

*සටහන.-* එම පෙත්සමේ විභාගයට පෙනී සිටීම සඳහා අදහස් කරන මොනයම් හෝ අයකු විසින් පහත නම් සඳහන් නීතිඥ උදය ධම්මික ගබඩාගේ මහතා වෙත තමන්ගේ එම අදහස් පිළිබඳව දැන්වීමක් ලිඛිතව භාරදීම හෝ තැපෑලෙන් එවීම කළ යුතු වේ. එම දැන්වීමෙහි එම පුද්ගලයාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් එහි නම සහ ලිපිනය ද සඳහන් කර එකී පුද්ගලයා හෝ ව්‍යාපාර ආයතනය හෝ ලේඛනගත නීතිඥයකු වෙතොත් එම නීතිඥයා විසින් අත්සන් කර 2013ක් වූ දෙසැම්බර් මස 10 වැනි දින පස්වරු හයට පෙර ලැබෙන සේ භාරදීම හෝ තැපෑලෙන් එවන්නේ නම් තැපෑලෙන් එවීම කළ යුතු ය.

උදය ධම්මික ගබඩාගේ,
අංක 272, පංසල පාර,
තලපත්පිටිය, නුගේගොඩ.

11-168

**ශ්‍රී ලංකා වෘත්තීයවේදී බැංකුකරුවන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

රොෂාන් රණසිංහ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 48(1) දරන ස්ථාවර නියෝගය යටතේ "ශ්‍රී ලංකා වෘත්තීයවේදී බැංකුකරුවන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි.-

1. ශ්‍රී ලංකාව තුළ මනා බැංකුකරණ ව්‍යුහයක් පවත්වා ගෙන යෑමට හා සංවර්ධනය කිරීමට සහාය වීම,
2. ශ්‍රී ලංකාව තුළ හෝ පිටත බැංකුකරණ හා මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ අධ්‍යයන කටයුතු සිදු කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැලැස්වීම ; සහ
3. බැංකුකරණ හා මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ අධ්‍යයන හා පර්යේෂණ දිරිගැන්වීම සඳහා ත්‍යාග හා ශිෂ්‍යත්ව හෝ අන්කවර හෝ ප්‍රදානයන් පිරිනැමීම,

යනාදිය වේ.

රොෂාන් රණසිංහ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

11-341

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.